**පාතදුම්බර ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**
**-------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**------------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 18 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**---------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------------**

(අ) ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමුච්චිත අරමුදල් ශේෂය රු.25,777,389 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | 2020 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. |
| (ii) | කලින් ලද ආදායම් ගිණුමේ ශේෂය රු.864,678 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | 2020 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. |
| (iii) | ලැබිය යුතු වරිපනම් රු.507,535 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | සභාවේ වරිපනම් මෘදුකාංගයේ දෝෂ නිසා මෙම අඩුපාඩුව සිදුවී ඇත. නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ අවසන් මාස 06 සඳහා ලැබිය යුතු උසාවි දඩ ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | ආදායම් පරීක්ෂකවරුන්ට උසාවි රෙජිස්ටාර්වරුන්ට ලිඛිතව දැනුම් දී ඇත. |

| | | | |
|---|---|---|---|
| (v) | ඊ - නැණ පියස ගිණුම් ශේෂය රු.82,246 ක් වුවත් එය රු.117,873 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.35,627 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ. | 2020 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. |
| (vi) | සේවක ඇප තැන්පත් ආයෝජන රු.367,739 ක් වුවත්, එහි වගකීම් රු.131,353 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතු වේ | 2020 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කරන බව දන්වමි. |

(ආ) අසම්භාව්‍ය බැරකම්

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් 16 දෙනෙක් නඩු පවරා තිබූ අතර, ඒ පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර නොතිබුණි. | අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | 2020 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ සටහන් මඟින් හෙළිදරව් කිරීමට කටයුතු යොදා ඇත. |

(ඇ) නොසැසඳුනු ගිණුම්

------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.162,392,470 ක් වූ ගිණුම් විෂයයන් 11 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර, රු.8,673,170 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් කළ යුතු වේ. | මෙම වෙනස සොයා බලා නිරවුල් කර ගන්නා බව දන්වමි. |

(ඈ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වසර 1 සිට 3 දක්වා කාලයට අදාළ ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.7,968,826 ක් හා වසර 3 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.724,002 ක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම ශේෂ සොයා බලා කඩිනමින් නිරවුල් කරන බව දන්වමි. |
| (ii) | වසර 1 සිට 3 දක්වා කාලයක් ඉක්මවා තිබුණු ගෙවිය යුතු ශේෂවල එකතුව රු.29,600,752 ක් හා වසර 3 ට වැඩි ශේෂවල එකතුව රු.3,883,094 ක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම ශේෂ සොයා බලා කඩිනමින් නිරවුල් කරන බව දන්වමි. |

(ඉ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.107,738,706 ක් වූ ගිණුම් විෂයයන් 3 කට අදාළව ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන යනාදී සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම්ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ලේඛන යාවත්කාලීන කිරීමටත්, 2020 මූල්‍ය ප්‍රකාශන සමඟ උපලේඛන සැපයීමට කටයුතු යොදන බව දන්වමි. |

**1.4 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | වසර 02 ක් ඉක්මවූ රු.1,626,977 ක් වටිනා පොදු තැන්පතු 126 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | කොන්ත්‍රාත්කරුවන් ඉල්ලා ඇති ඇප තැන්පත් නිදහස් කිරීමට හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) 2010 නොවැම්බර් 24 දිනැති පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ 5/2010 | සුදුසුකම් සම්පූර්ණ නොවූ මහජන සම්බන්ධතා නිලධාරියෙකු බඳවාගෙන 2018 අගෝස්තු සිට 2019 දෙසැම්බර් දක්වා වැටුප් ලෙස රු.141,000 ක් ගෙවා තිබුණි. | චක්‍රලේඛයේ සුදුසුකම් පරීක්ෂා කර බඳවා ගැනීම කළ යුතු වේ. | විමසුමේ දක්වා ඇති අඩුපාඩුව හැර අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර ඇති බව දන්වා ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,423,583 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,876,032 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 5,530,000 | 5,850,455 | 4,003,755 | 4,159,134 | 7,083,000 | 7,486,367 | 8,149,308 | 4,313,761 |
| (ii) | කුලී | 5,248,400 | 3,481,842 | 2,947,656 | 881,866 | 657,000 | 2,127,950 | 2,137,240 | 412,211 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,150,500 | 2,300,000 | 2,803,810 | 568,708 | 2,200,000 | 2,200,000 | 2,420,040 | (220,040) |
| (iv) | වෙනත් ආදායම් | 33,266,500 | 21,420,155 | 2,654,679 | 313,158 | 12,986,720 | 14,385,688 | 1,924,688 | 21,290,519 |
| | | 45,245,400 | 33,052,452 | 12,409,900 | 5,922,866 | 22,926,720 | 26,200,005 | 14,631,276 | 25,796,451 |

### 2.2.2 කඩ කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1996 වර්ෂයේ සිට පැවත එන මස්කඩ බදු දීමෙන් ලැබිය යුතු ආදායම් රු.313,158 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයකරගත යුතු මුදල් අය කළ යුතු වේ. | මුදල් රෙගුලාසි 104 පරීක්ෂණයක් පැවැත්වෙන බැවින් එහි තීරණය පරිදි කටයුතු සිදුකරන බව දන්වමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.385,412 ක් හා රු.23,317,474 ක් විය. | අදාළ මුදල් සභාව වෙත ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ආදාළ ආයතන හා ආදායම් පරීක්ෂකවරු දැනුවත් කර ඇති බව දන්වමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 18 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවට ආදායම් උපයාගතහැකි අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීම කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

(ආ) අපේක්ෂිත ප්‍රතිලාභ (out come) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 වර්ෂයේදී රු.1,980,000 වැය කර ඉදිකළ අලුත්ගම පොළ ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කිරීම කළ යුතු වේ. | විධිමත් උපයෝජනය කිරීමට ප්‍රජාව දැනුවත් කර සක්‍රියව පවත්වාගෙන යාමට කටයුතු කරන බව දන්වමි. |

(ඇ) පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මඩවල නගරය අසලින් ගලායන බලතොට ඔය අවහිර වන ලෙස අනවසර ඉදිකිරීම් සිදුකර තිබූ අතර, ඔයට අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් ඔය අපිරිසිදු වී තිබුණි. අනවසර ඉදිකිරීම් හා කැළි කසළ බැහැර කරන්නන් පිළිබඳ සොයාබලා ඒ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | පරිසරයට හානි වන ලෙස කසළ බැහැර නොකිරීම. | මෙම තත්ත්වය වළක්වා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ප්‍රමාණවත් අයුරින් හඳුනාගෙන නොමැති අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටු කර නොමැත. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2020 අයවැය ලේඛනය තුළ ප්‍රතිපාදන වෙන්කර 2020 තුළ ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පාතදුම්බර හා කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභා දෙක ඒකාබද්ධව ආදායම් හා වියදම් සමව බෙදා ගැනීම සඳහා ගිවිසුම්ගත වූ ව්‍යාපෘතිය වෙනුවෙන් පාතදුම්බර ප්‍රාදේශීය සභාව විසින් රු.3,339,857 ක වියදමක් දරා ඇතත් කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර මෙම ව්‍යාපෘතිය විධිමත් කිරීමට කටයුතු කිරීම කළ යුතු වේ. | මේ සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කර ඇතත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණ බව දන්වමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක පුරප්පාඩු 15 ක් හා සේවක අතිරික්තතා 2 ක් විය. | සේවක පුරප්පාඩු පුරවා ගැනීම කළ යුතු වේ. | නව රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇති බව දන්වමි. |
| (ආ) | ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 7 දෙනෙකුගේ අය නොවන රු.816,847 ක ණය ශේෂයක් පැවතුණි. | හිඟ සේවක ණය ශේෂ අයකර ගත යුතු වේ. | මෙම අය ස්ථාන මාරු වී ගිය ආයතනවලින් ණය වාරික නොකඩවා අයවන බවත් සේවය හැරගිය නිලධාරියා සම්බන්ධයෙන් ඇපකරුවා දැනුවත් කර ඇති බව දන්වමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු රු.6,794,115 ක් වටිනා වාහන 09 ක් වසර 05 - 10 ක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින අතර, එම වාහන යථා තත්ත්වයට පත් කර ගැනීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රයෝජනයට ගත නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | වාහන දැනට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින හෙයින් වෙන්දේසි කිරීමට සභා තීරණයක් ගෙන ඇති බව දන්වමි. |